# මොඩියුල අංක 05

# කාර්යමූල පර්යේෂණ

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා ක්‍රියාමූලික පර්යේෂණ යොදා ගැනීම

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට උද්ගතවන ගැටලු ඔබ විසින්ම ගැලපෙන ලෙස විසඳාගෙන / ගැටලු විසඳෙන ලෙස ඔබ වෙනස් වෙමින් සාර්ථකත්වයට පත්වීමට ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවේශය ඔස්සේ ඔබට හැකි ය. මේ පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කිරීමෙන් ඔබට පහත දැක්වෙන අරමුණු ඉටුකර ගත හැකි ය.

**අරමුණු:**

1. යම් ක්‍රියාවලියක දී ප්‍රත්‍යාවේක්ෂණය (reflection) ඔස්සේ ගැටලු හඳුනාගැනීමේ කුසලතාවය ප්‍රදර්ශනය කරයි.
2. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවේශය යොදා ගනී.
3. ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවේශය යොදා ගනිමින් පන්ති කාමරයේ දී / පාසලේ දී මතුවන ගැටලු විසඳීමට ගුරුවරයා මැදිහත් වෙයි.

මෙම අධ්‍යයන කාර්යය සඳහා ස්වයං කැපවීමකින් යුතුව ඔබ එළඹුනහොත් පහත දැක්වෙන ඉගෙනුම් පල ඔබට ලඟා කර ගත හැකි ය.

**ඉගෙනුම් පල:**

1. පාසලේ දී හෝ පන්ති කාමරයේ දී ගුරු පර්යේෂකයාට මතුවන ගැටලු පර්යේෂකයා ගැලපෙල ලෙස ස්වයං වෙනස්වීමේ ක්‍රියාවලියකට අනුගත වීමෙන් විසඳා ගනී.

2. සිසුන්ට මතුවන අධ්‍යාපනික, සාමාජීය හා වෙනත් ක්ෂේත්‍රවල ගැටලුවල දීත් ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවේශය යොදා ගත හැකි අවස්ථාවන් පෙළ ගස්වයි.

3. ගැටලුවකට අදාලව ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කිරීමේ දී (අත්ත තොරතුරු බවට පත්කිරීම) හැකියාව ලබන අතර ඒ ඇසුරින් ගැටලු විසඳුම් සැලසුම් කරයි.

පන්තිකාමරයේදී, පාසලේ දී, හෝ ඉගෙනුම් ඉගැන්විම් ක්‍රියාවලිය අතරතුරදී ඔබට හමුවන විවිධ ගැටලු විසදාගැනීම සඳහා ගුරු සංවර්ධන ක්‍රමයක් වශයෙන්ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රමවේදය ඵලදායී ලෙස යොදා ගත හැකි අකාර පියවරෙන් පියවර පහත පරිදි අධ්‍යයනය කරමු.

මුලින්ම, ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳව මූලික අදහසක් ලබාගැනීමට පහත වීඩියෝ දර්ශනය ඔබට උපකාරී වනු ඇත. අවධානයෙන් එය අධ්‍යයනය කරන්න.

https://www.youtube.com/watch?v=Ov3F3pdhNkk(සිංහල බසින් පසුබිම් කථනය)

https://www.youtube.com/watch?v=Ov3F3pdhNkk (ඉංග්‍රීසි බසින් පසුබිම් කථනය)

ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය සිදුකළහැකි ආකාරය පිළිබඳව සවිස්තරව දැනගැනීමට ලේඛනයක් පහතින් දැක්වේ. එය පරිශීලනය කරන්න

(ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳව පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් උපුටා ගන්නා ලදී.)

**ක්‍රියා මූලික පර්යේෂණ**

දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා කෙරෙන ක්‍රමවත් සොයා බැලීමක් පර්යේෂණයක් ලෙස හැඳින්විය හැකිය. එහෙත් සෑම සෙවීමක්ම පර්යේෂණයක් ලෙස සැලකීමට නොහැකිය. දැනුම දියුණු කර ගැනීම සඳහා ක්‍රම ශිල්ප එකකට වඩා වැඩි සංඛ්‍යාවක් ඇති හෙයින් පර්යේෂණය එකම ආකෘතියක කාර්යයක් නොව විවිධ ආකෘති යටතේ හැසිරවීමට හැකි කාර්යයක් වනු ඇත.

අධ්‍යාපන පර්යේෂණයක් යනු, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැන නැගී පවතින ගැටලු සඳහා විසඳුම් සෙවීමට කරනු ලබන විධිමත් අධ්‍යයනයකි. අධ්‍යාපන පර්යේෂණ සඳහා විවිධ පර්යේෂණ ප්‍රවේශ පර්යේෂකයන් විසින් අනුගමනය කරනු ලබන අතර, මේවා අතුරින් ක්‍රියාමූලික පර්යේෂණ බෙහෙවින් ප්‍රචලිත ප්‍රවේශයක් බවට වර්තමානයේ දී පත්ව ඇත.

ක්‍රියා බද්ධ පර්යේෂණ, පන්ති කාමර පර්යේෂණ, සක්‍රීය පර්යේෂණ සහ ක්‍රියාමූලික පර්යේෂණ ආදි විවිධ නම්වලින් හැඳින්වෙන මෙම පර්යේෂණ ක්‍රමය අද බොහෝ ගුරු අධ්‍යාපන පාඨමාලාවල අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. විශේෂයෙන් අධ්‍යාපන විද්‍යාපීඨ පූර්ව සේවා ගුරු අධ්‍යාපන පාඨමාලාවේ සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාලාභීන් තම පාඨමාලාවට අදාළව තෝරා ගත් ගැටලුවක් ඔස්සේ ක්‍රියාමූලික පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කර ඇත.

e-Learning by TEA
Teacher Education Administration Branch

**ක්‍රියාමූලික පර්යේෂණයක් යනු කුමක් ද?**

ක්‍රියාමූලික පර්යේෂණ යන්න විවිධ පර්යේෂකයන් විසින් විවිධ අන්දමින් නිර්වචනය කොට ඇත.

> " මෙය සිදුවිය යුත්තේ මෙසේ ය" යනුවෙන් කල්පනා කර මෙතෙක් කර ගෙන ආ වෘත්තිය ක්‍රියා මාර්ගය වෙනස් කිරීමට තීරණය කර තමාගේ පන්ති කාමරය ගැන විමසා බැලීමට ගුරුවරයකු තීරණය කළ විට ක්‍රියාමූලික පර්යේෂණය ඇරඹේ යයි හල්ට්ස්ලර්, කැසිඩ් සහ කප් (1986) පවසා ඇත.
>
> "කුඩා පරිමාණයේ මැදිහත්වීමක් තමන් විසින් ම සිදු කර එම මැදිහත් වීමේ බලපෑම සමීපව විභාග කර බැලීම ක්‍රියාමූලික පර්යේෂණ බව" හැල්සේ (1972) පැවසීය.
>
> "ක්‍රියාමූලික පර්යේෂණය ක්‍රියාවලිය ගැටලුකාරී තත්ත්වයක් අනාවරණය කර ගැනීමටත්, ප්‍රතිකාර්යය ක්‍රියා මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කිරීමටත්, නියාමනයටත් යෝග්‍ය ක්‍රමවේදයක් බව" බර්න්ස් (1998) පවසා ඇත.

මේ අනුව ක්ෂේත්‍රයේ වෙනස්කම් සිදු කළ යුතු හෝ සංවර්ධනය කළ යුතු අවස්ථාවක් විමර්ශනය කර අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා තිබෙන කාර්යක්ෂම සහ උචිත මාර්ගයක් ලෙස ක්‍රියාමූලික පර්යේෂණ හඳුනා ගත හැකිය.

**ක්‍රියාමූලික පර්යේෂණ සාම්ප්‍රදායික පර්යේෂණවලින් වෙනස් වන ආකාරය-**

ක්‍රියාමූලික පර්යේෂණ එයටම සුවිශේෂී වූ පහත සඳහන් අංග ලක්ෂණ දරයි.

1. ක්‍රියාමූලික පර්යේෂණ සමාජ වාතාවරණයක්, සමාජ අවස්ථාවක් පිළිබඳව ආසන්නතම වගකීම ඇති පිරිසක් විසින් කරනු ලබන්නක් වීම්.
2. මැදිහත්වීමේ ලක්ෂණය ක්‍රියාමූලික පර්යේෂණවල අනිවාර්යයෙන් දක්නට ලැබීම
3. තමන් නියැළෙන වෘත්තිමය ව්‍යවහාරය සංවර්ධනයට යොමුවීම සහ ඒ සඳහා කැපවීම ක්‍රියාමූලික පර්යේෂණයේ යෙදෙන්නා තුළ තිබීම.
4. වෙනත් පර්යේෂණවලදී මෙන් පර්යේෂණකරණයේදී අනුගමනය කළ යුතු තාක්ෂණික ක්‍රමවේද දැඩිව අනුගමනය කිරීමේ අවශ්‍යතාවක් නොතිබීම.
5. අනුගමනය කරන මැදිහත්වීමේ ක්‍රියාදාමය ප්‍රත්‍යවේක්ෂණයට ලක් කිරීම.
6. තමන් එදිනෙදා නියුක්ත වන කාර්යයේ යෙදීමට ඕනෑවට වඩා බාධාවක් නොවන පරිද්දෙන් පර්යේෂණ ක්‍රම සහ ක්‍රම ශිල්ප සකස් කර ගනු ලැබීම.
7. පර්යේෂණ කාර්යයේදී විද්‍යාත්මක ක්‍රමය දැඩිව අනුගමනය නොකිරීම.
8. මෙම පර්යේෂණ ක්‍රමය ඔස්සේ එළඹෙන නිගමනය අනෙකුත් අවස්ථාවනට හා ස්ථානවලට සාමාන්‍යකරණය කිරීම සිදු නොකිරීම.
9. පර්යේෂණ ක්‍රම විද්‍යාවේදී වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට ඉඩ ලබා දෙන ක්‍රම ශිල්පයක් ලෙස ද සැලකිය හැකිවීම.


**ක්‍රියාමූලික පර්යේෂණයක පියවර**

ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලියට පොදු වූ අංග ලක්ෂණ හඳුනා ගත හැකි සේ ම ඒ ඒ සුවිශේෂ ගැටලුව හා සුවිශේෂ අවස්ථාව අනුව කෙරෙන ක්‍රි යාමූලික පර්යේෂණවලට ඒ එකිනෙකට සුවිශේෂ වූ අංග ලක්ෂණ ඇත්තේ ය. මේ නිසා ක්‍රියාමූලික පර්යේෂණවල පියවර සැසි චක්‍රීය ආකෘතියක් මගින් ඉදිරිපත් කිරීම අසීරු ය.

ක්‍රියාමූලික පර්යේෂණයක ප්‍රධාන පියවර වන්නේ, ප්‍රත්‍යවේක්ෂණය හෙවත් ස්වයං අවලෝකනයයි. මෙම අදහස පාදක කර ගනිමින් 1944 දී කර්ට්ලෙවින් ක්‍රියාමූලික පර්යේෂණයක පියවර සර්පිලාකාර චක්‍රයකින් ඉදිරිපත් කළ හැකි බවත්, එවැනි එක් චක්‍රයක් සඳහා ප්‍රධාන පියවර හතරක් ඇතුළත් කළ හැකි බවත් පවසන ලදි.

ඒවා නම් සැලසුම් කිරීම, ක්‍රියා කිරීම, නිරීක්ෂණය හා ප්‍රත්‍යවේක්ෂණයයි. මෙම මූලික අදහස් සැලකිල්ලට ගනිමින් ක්‍රියාමූලික පර්යේෂණයක් සැලසුම් කොට ක්‍රියාවට නැංවීමේ පියවර රැසක් හඳුනා ගත හැකි අතර ඒවා අනුපිළිවෙළින් පහත ඉදිරිපත් කෙරේ.

**ක්‍රියාමූලික පර්යේෂණයක පියවර**




මෙම මූලික අදහස් සැලකිල්ලට ගනිමින් කාර්යමූලිකක්‍රියාමූලිකපර්යේෂණයක් සැලසුම් කොට ක්‍රියාවට නැංවීමේ පියවර රැසක් හඳුනා ගත හැකි අතර, ඒවා අනුපිළිවෙළින් පහත ඉදිරිපත් කෙරේ.

1. ගුරු වෘත්තියට අදාළ ව ඔබගේ කාර්ය කොටස් හා බැඳී පන්ති කාමර මට්ටමේ වෙනසක් අවශ්‍ය අවස්ථාවක් හඳුනා ගැනීම
2. එම අවස්ථාව සමග සබඳතාවක් පවත්නා පසුබිම් දත්ත හඳුනා ගැනීම
3. පසුබිම් දත්ත විශ්ලේෂණයට ලක් කරමින් පර්යේෂණ ගැටලුව පුළුල්ව අධ්‍යයනයට ලක් කිරීම
4. පර්යේෂණ අරමුණු ගොඩ නගා ගැනීම
5. අවස්ථාව වෙනස් කිරීම සඳහා යෝග්‍ය මැදිහත් වීමේ වැඩ සටහනක් කාල රාමුවකට අනුව සැලසුම් කිරීම
6. එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම් සකස් කර ගැනීම
7. මැදිහත් වීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීම
8. ක්‍රියාවට නගන වැඩසටහන නිරීක්ෂණයට ලක් කිරීම, නියාමනය කිරීම හා ප්‍රතිඵල වාර්තා කිරීම
9. මැදිහත්වීමේ වැඩසටහන ඇසුරින් එක් රැස් කර ගත් දත්ත විශ්ලේෂණයට ලක් කිරීම
10. විශ්ලේෂිත දත්ත ඇසුරින් අදාළ අවස්ථාව වෙනසකට ලක් වී ඇත්දැයි සොයා බැලීම/ ප්‍රත්‍යවේක්ෂණය
11. අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොමැත්තේ නම් ප්‍රතිසැලැස්මක් සැකසීම සහ ඊට අදාළ ව ක්‍රියාකාරකම් සැකසීම
12. ප්‍රතිසැලසුම් ක්‍රියාවට නැගීම
13. ප්‍රතිසැලසුම් වැඩ සටහන නිරීක්ෂණයට ලක් කිරීම සහ ඒ ආශ්‍රිතව රැස් කර ගත් දත්ත විශ්ලේෂණයට ලක් කිරීම තුළින් අපේක්ෂිත අරමුණුවලට ළඟාවී තිබෙන්නේ දැයි ප්‍රමාණනය කිරීම
14. අපේක්ෂිත වෙනස කරා ළඟා වන තෙක් මෙවන් ප්‍රතිසැලසුම් යොදා ගැනීම

**ක්‍රියාමූලික පර්යේෂණයක් සඳහා උචිත පර්යේෂණ ගැටලුවක් හඳුනා ගැනීම**

ක්‍රියාමූලික පර්යේෂණ සඳහා යෝග්‍ය පර්යේෂණ ගැටලුවක් හඳුනා ගැනීමේ හැකියාව ශික්ෂණලාභියා ගුරුවරුන් තුළ තිබිය යුතුය. පන්ති කාමරය තුළ පැන නැගී තිබෙන ගැටලුවක් සඳහා නිශ්චිත කැපී පෙනෙන විසඳුමක් පවතින අවස්ථා ක්‍රියාමූලිකපර්යේෂණ සඳහා තෝරා ගැනීම එතරම් උචිත වන්නේ නැත.

ක්‍රියාමූලික පර්යේෂණ සඳහා උචිත ගැටලුවක් තෝරා ගැනිමේ දි තමා විසින් ම තමාගෙන් ම අසා පිළිතුරු ලබා ගත යුතු ප්‍රශ්න කිහිපයක් පවතී. ඒවා නම්,

1. වෙනසක් අවශ්‍ය අවස්ථාව කුමක් ද?
2. එම වෙනස අවශ්‍ය බව ප්‍රදර්ශනය වන්නේ කෙසේ ද?
3. මේ සඳහා බලපෑ හැකි පසුබිම් සාධක මොනවා ද?
4. එම අවස්ථාව වෙනස් කිරීමට ගත හැකි කුඩා පරිමාණ ක්‍රියා මාර්ග මොනවා ද?
5. යථෝක්ත අදාළ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිඵල මොනවා ද?

මෙම ප්‍රශ්නවලට ඔබ විසින් තෝරා ගත් අවස්ථාව සඳහා සාර්ථක පිළිතුරු සපයන්නේ දැයි අවධානය යොමු කරන්න. මේ අන්දමින් යම් පර්යේෂණ ගැටලුවක් දෙස විශ්ලේෂණාත්මක දෘෂ්ටි කෝණයකින් අවධානය යොමු කර ඔබගේ ක්‍රියාමූලික පර්යේෂණය සඳහා උචිත අවස්ථාවක් තෝරා ගන්න.

**ක්‍රියාමූලික පර්යේෂණවලදී දත්ත රැස් කිරීමට ඉවහල් කර ගත හැකි ක්‍රම**

1. ප්‍රත්‍යවේක්ෂණ සටහන්
2. සම්මුඛ සාකච්ඡා / නාභිගත සම්මුඛ සාකච්ඡා
3. ප්‍රශ්නාවලි
4. නිරීක්ෂණ
5. විවිධ ලේඛන අධ්‍යයනය කිරීම. (උදාහරණ - ලොග් සටහන්, ලකුණු වාර්තා, පැමිණීමේ ලේඛන අධ්‍යයනය)
6. ආකල්ප පරිමාණ
7. ශ්‍රව්‍ය/දෘශ්‍ය පටිගත කිරීම.
8. ක්ෂේත්‍ර සටහන්
9. අනාවරණ පරීක්ෂණ, සමාජමිතික පරීක්ෂණ

**ක්‍රියා මූලික පර්යේෂණ සඳහා යොදා ගත හැකි ගැටලු සඳහා උදාහරණ**

1. තෝරා ගත් අකුරු කිහිපයක් නිවැරදිව ලිවීමේ කුසලතා හතරවන ශ්‍රේණියේ සිසුන් කිහිප දෙනෙකු තුළ වර්ධනය කරන්නේ කෙසේ ද?
2. විෂයයට අදාළ ව පෙළ පොත නිවැරදි ව භාවිත කිරීමේ සිසු කුසලතා වර්ධනය කරන්නේ කෙසේ ද?
3. පන්ති කාමරයේ විනය නීතිරීති කඩ කිරීමෙන් තොර විනය ගරුක පන්තියක් ඇති කිරීමට මා ක්‍රියා කළ යුත්තේ කෙසේ ද?
4. එකතු කිරීම හා සබැඳි මූලික ගණිතමය කුසලතා වර්ධනයට මා කුමක් කළ යුතු ද?
5. ඉංග්‍රීසි ඉංග්‍රීසි විෂය ඉගෙනුමට සිසුන්ගේ පෙලඹුම ඇති කරන්නේ්නේ කෙසේ ද?

මෙවැනි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ගුරුවරයා ක්‍රියාමූලික පර්යේෂණයක් කිරීමෙන් පාර්ශ්ව ගණනාවකට ප්‍රතිලාභ අත්වේ.

ගුරුවරයාට : ඉගැන්වීම් කුසලතා, සබඳතා, කළමනාකරණ කුසලතා ආදි

සිසුන්ට : සාධන හා පෞරුෂ, සමාජ කුසලතා (ඉලක්ක කණ්ඩායමට)

පාසලට : ඉගෙනුම් සංස්කෘතිය බලවන්තකරණය


e-Learning by TEA
Teacher Education Administration Branch

පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඉහත දක්වා ඇති ක්‍රම මෙන් ම පාසලට සහ අවස්ථාවට වඩාත් උචිත වෙනත් ක්‍රම හා ක්‍රියාකාරකම් ද පාසලට යොදා ගත හැකි ය.

මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දි ඒ සම්බන්ධව නියාමනයක් හා ඇගයීමක් පාසල් මට්මමේ සිට ජාතික මට්ටම දක්වා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය යි.

ක්‍රියාමූලික පර්යේෂණයක සාර්ථකත්වය සඳහා අවශ්‍ය පර්යේෂණාත්මක දත්ත ලබා ගැනීම තුළින් ගැටලුව හඳුනා ගැනීම අතිශයින් වැදගත් වන බව තහවුරු කරගන්න. නිවැරදිව ගැටලුව හඳුනාගත් පසු එය විසඳීම සඳහා ක්‍රමානුකූලව අදියරෙන් අදියර මැදිහත් විය යුතුය. එම සෑම මැදිහත්වීමක් අතරදීම ප්‍රත්‍යාවේක්ෂණයේ යෙදීම මගින් අදාළ මැදිහත්වීමේ සාර්ථක - අසාර්ථක බව එනම් ඵලදායීත්වය ඔබට තක්සේරු කරගත හැකි වනු ඇත.

ඉහත දී ඔබ අධ්‍යයනය කළ ක්‍රියාවලිය පහත ආකාරයේ සරල සටහනකින් ද දැක්විය හැකි බව දැන් ඔබට තහවුරු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.




A:

**උදාහරණ:**

කළහකාරී හැසිරීම් සහිත ශිෂ්‍යයකු= හේතු රහිතව නිතරම පන්ති කාමරයේ අනෙක් සිසුන්ට හිංසා කිරීම.

B:

**උදාහරණ:**

මෙම ශිෂ්‍යයා පිළිබඳව පහත ක්‍රමවේදයන් ඔස්සේ දත්ත රැස් කර හැක.

**නිරීක්ෂණ:**

පාඩමක් අතර තුරදී, විවේක කාලයදී, පුස්තකාලයේදී, ක්‍රීඩා පිටියේදී, පාසලට එන යන අතර තුරදී හෝ උදෑසන රැස්වීමකදී

**සම්මුඛ සාකච්ඡා:**

ශිෂ්‍යයන්ගේ මිතුරන් වෙතින්, අනෙකුත් ගුරුවරුන් හා දෙමාපියන් ආදීන් වෙතින් තොරතුරු ලබා ගැනීම.

**ලේඛන පරීක්ෂාව:**

පාසලේ ලකුණු වාර්තා පොත (වාර විභාග ලකුණු පරීක්ෂාකර බැලීම සඳහා),නාමලේඛන (පැමිණීම පරීක්ෂාකර බැලීම සඳහා),

**පන්ති ලිපි ගොනු**

එම ශිෂ්‍යයා පිළිබඳව පාසල් ලොග් පොත වැනි ලේඛනයක යමක් ලියවී ඇත්නම් එම තොරතුරු ද ලබා ගත හැකිය.

**C:**

මෙම ශිෂ්‍යයා යහමගට ගැනීම සඳහා ඔහු වෙනුවෙන් ගුරු පර්යේෂකයාගේ අපේක්ෂිත වෙනස් වීම් අනුපිළිවෙළ දැක්වෙන සැළසුමකි.

**උදාහරණ:**

- අනෙකුත් සිසුන්ට ගැටලුවක් ඇති නොවන ආකාරයට අදාල ශිෂ්‍යයාට පන්ති නායකත්වය පැවරීමට සැළසුම් කිරීම.
- වෙනත් ගැටලු ඉසුමතු නොවන ආකාරයට ශිෂ්‍යයාට සුවිශේෂී වෙනත් වගකීම් පැවරීමට සැළසුම් කිරීම.

**D:**


ප්‍රත්‍යාවේෂණයේ යෙදෙමින්, සැළසුම් කිරීමේ අදියරේදී ආදාල ගැටලුව විසදීම සඳහා සැළසුමු කළ පරිදි අවධානයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම මෙම අදියරේදී අපේක්ෂා කෙරේ.එලෙස සැළසුම ක්‍රියාත්මක කිරීමේදී ඉස්මතු වන සාර්ථක හා අසාර්ථකත්වයට අදාලව ප්‍රත්‍යාවශේෂණය හා දත්ත ලබා ගැනීම නිරන්තරව සිදු කළ යුතුය.

e-Learning by TEA
Teacher Education Administration Branch

ඉහත සටහන තවදුරටත් සවිස්තරව පහත ආකාරයට ඇඳිය හැකිය.

## ක්‍රියාමූලික පර්යේෂණ සර්පිලය

# The Action Research Spiral




ක්‍රියාමූලික පර්යේෂණයක ඉහත අදියර පිළිබඳව සවිස්තරව දැනගැනීම සඳහා පහත වීඩියෝ දර්ශනය ඔබට උපකාරී වනු ඇත. ක්‍රියාවලිය පිළිබඳව අවධානයෙන් එය නරඹන්න.

https://www.youtube.com/watch?v=CgiUO7A-A9M

වීඩියෝ දර්ශනය නැරඹීමෙන් පසු පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ කරන්න

1. ගුරුතුමිය (පර්යේෂිකාව) මුලින්ම ගැටලුව හඳුනාගන්නේ කෙසේ ද?
2. ගැටලුව තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා / අධ්‍යයනය සඳහා, ගුරුතුමිය (පර්යේෂිකාව) භාවිත කරන ක්‍රමවේද කීයක් ඔබට හඳුනා ගත හැකිද? ඒ මොනවාද ?
3. ගැටලුව විසදීම සඳහා ගුරුතුමියගේ (පර්යේෂිකාවගේ) පළමු මැදිහත්වීම ඔබ හඳුනාගත්තේද? ඒ කුමක්ද ?
4. සමස්ත ගැටලුව විසදා අවසන් වන විට ගුරුතුමිය (පර්යේෂිකාව) සිදුකළ මැදිහත්වීම් ගණන නම් කරන්න.එම අදියර ලියන්න?

ඉහත පුශ්න සඳහා ඔබ විසින් ලියන ලද පිළිතුරුවල නිවැරදිතාවය පහත යොමුවට පිවිසීමෙන් ඔබටම පරීක්ෂා කළ ගත හැකිය.

---

පිළිතුරු

1.

- ගුරුතුමියගේ ප්‍රත්‍යවේක්ෂණ ජර්නලය තුළින් /ජර්නලය ලිවීමෙන් ? ජර්නලය නැවත පරීක්ෂා කිරීමෙන්
- පසුකාලීන ප්‍රත්‍යාවශේෂණය (Reflection on action) තුළින්

2.

ප්‍රධාන වශයෙන් 3කි.

- ශිෂ්‍යාවන්ගේ චර්යාවන් ගැඹුරින් නිරීක්ෂණයෙන් (නිරීක්ෂණය),
- ශිෂ්‍යයාගේ අභ්‍යාස පොත් පරීක්ෂා කිරීම.(ලේඛණ පරීක්ෂාව),
- ශිෂ්‍යයා සමග/ ශිෂ්‍යයාගේ පියා සමග සාකච්ඡා කිරීමෙන් (සම්මුඛ සාකච්ඡා)

3.

- ශිෂ්‍යයා සමග සාකච්ඡා කිරීම
- තමා සමීපයේ සිට අභ්‍යාසය කරන ලෙස ඇයට පැවරීම.

4.

- මැදිහත්වීම් ගණන 3කි.
- අභ්‍යාස සිදු කිරීමට පැවරීම.
- පියාව දැනුවත් කරීම.
- නායකත්වය ලබා දීම.

5.

- පසුකාලීන ප්‍රත්‍යාවශේෂණය (Reflection on action)
- සමකාලීන ප්‍රත්‍යාවශේෂණය (Reflection in action)
- පසුකාලීන ප්‍රත්‍යාවශේෂණය (Reflection for action)

**ඔබගේ පිළිතුරුවලින් කීයක් නිවැරදි ද?**

ප්‍රශ්න පහටම නිවැරදි පිළිතුරු සැපයීමට ඔබ සමත් වූයේනම් ඉහතින් ඉදිරිපත් කළ ඉගෙනුම් අවස්ථාවට අදාලව මූලික දැනුම ඔබ සතු වේ.සුභ පැතුම් පිළි ගන්න.

තවදුරටත් නිවැරදි විය යුතු පිළිතුරු තිබුණේනම් නැවත වරක් මෙහි මුලටම ගොස් නැවත අධ්‍යයනය කරන්න.නැවතත් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට උත්සාහ කරන්න.

දැන් ඔබගේ සාර්ථකත්වය පිළිබඳ ඔබටම සතුටක් දැනේදැයි සිතමු.

---

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගණිත විෂයයට අදාළ විෂය සංකල්ප සිසුන් ට වඩාත් පහසුවෙන් තහවුරුකරවීම සඳහා ක්‍රියාමූලික පර්යේෂණ උපයෝගී කරගත් අවස්ථා දෙකක් සඳහා උදාහරණ පහත දැක්වේ.

------------------------

ගණිතය විෂයයට අදාල ජ්‍යාමිතිය සංකල්පය සරලව ඉගැන්වීම සඳහා ක්‍රියාමූලික පර්යේෂණයක් භාවිත කළ අවස්ථාවක් පහතින් ඔබට නැරඹිය හැකිය.

https://www.youtube.com/watch?v=nt5zjYLf3qA&feature=youtu.be

ගණිතය විෂයයට අදාල සදිශ සංඛ්‍යා සංකල්පය සරලව ඉගැන්වීම සඳහා ක්‍රියාමූලික පර්යේෂණයක් භාවිත කළ අවස්ථාවක් පහතින් ඔබට නැරඹිය හැකිය.

https://www.youtube.com/watch?v=tI8blfgntE0

ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳව තවදුරටත් දැනුවත්වීම සඳහා පහත වෙබ් අඩවි තවදුරටත් ඔබට උපකාර වනු ඇත.

http://www.moe.gov.lk/index.php?option=com_content&view=article&id=308&Itemid=311&lang=en

http://www.nie.lk/facdep60

http://nwpedu.lk/pdfup/index.php

https://www.youtube.com/watch?v=MDVH0u4tUWo

https://www.youtube.com/watch?v=lsnCX2h9HXY

https://www.youtube.com/watch?v=g_zFEoDgGZA

පන්ති කාමරයේදී ඔබට හමුවන සමහර සිද්ධීන් ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවේෂය ඔස්සේ පහසුවෙන් හා ඵළදායී ලෙස විසඳිය හැකි බව දැන් ඔබට වැටහෙනු ඇත.

- ඔබට පහසුවේ විසඳිය හැකි එවැනි සරල ගැටලු හැකි තරමක් කඩදාසියක ලියන්න.
- ඉහත දී ඔබ උගත් ක්‍රමවේදයන් සාකච්ඡා කරමින් ඔබ ලියූ ගැටලු අතරින් ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවේෂය පහසුවෙන් යොදා ගත හැකි එක් ගැටලුවක් තෝරා ගන්න.
- එම ගැටලුවට අදාල තවදුරටත් කරුණු සොයා බලන්න.හැකි සෑම ක්‍රමවේදයක් ඔස්සේම දත්ත රැස් කර ගන්න.
- ඔබට පහසු ක්‍රමවේදයන් යොදා ගනිමින් එම දත්ත විශ්ලේෂණය කර තොරතුරු බවට පත් කර ගන්න.
- ලබා ගත් තොරතුරු උපයෝගීකර ගෙන ඔබේ ගැටලුව විසඳීම සඳහා අදායර වශයෙන් වූ ක්‍රියාපිළිවෙළක් කාල රාමුවට අනුව සැළසුම් කරන්න.
- ඔබේ සැළසුමට අනුව ගැටලු විසඳීම සඳහා පලමු මැදිහත් වීම සිදු කරන්න. නියමිත කාලය යොදා ගනිමින් මැදිහත් වීමේ සාර්ථකත්වය පිළිබඳව පසුවිමසුමක් සිදු කරන්න.
- එම මැදිහත් වීම සාර්ථකනම් ඊළග අදියරට පිවිසෙන්න. මැදිහත් අසාර්ථ බව දැනෙන්නේනම් නැවත වෙනත් සුදුසු මැදිහත්වීමක් සිදු කර නැවත ප්‍රතිඵල පිළිබඳව සැළකිලිමත් වන්න.
- මේ අයුරින් ක්‍රියාමූලික පර්යේෂණ චක්‍රයට ආලව ඉදිරි පියවර ක්‍රියාත්මක කරමින් ප්‍රතිඵල ලබා ගන්න.

e-Learning by TEA
Teacher Education Administration Branch